**පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - 2013**

**------------------------------------------------------------**

පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා රජයෙන් සපයන ලද අරමුදල් යොදා ගනිමින් ව්‍යාපෘතියේ කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කරන ලද අතර එය ශ්‍රී ලංකා රජය හා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල අතර 2014 ජනවාරි 30 දින එළඹි ණය ගිවිසුම යටතේ මූල්‍යායනය කෙරේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වනුයේ පිළිවෙලින් එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරියයි. පළාත් 7 ක පදික මාර්ග උරහිස් සහිත මං තීරු දෙකකින් යුතුව පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි හා වාහන මෙහෙයුම් , මාර්ග නඩත්තු පිරිවැය, ගමන් කරන කාලය හා මාර්ග අනතුරු අඩු කිරීම් මගින් අදාළ ප්‍රදේශවල ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා දායකවීම ව්‍යාපෘතිය අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය කුවේට් ඩිනාර් මිලියන 10 කට සමාන රු මිලියන 4,632 ක් වන අතර, ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම මූල්‍යායනය කිරීම සඳහා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2018 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය

ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය ,ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ශ්‍රී ලංකා රජයෙන් සපයන ලද මුදල්වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙන ලද මුදල් යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

**3. මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම රු මිලියන 3.71 ක් විය. සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම |
| --- | --- |
| | රු මිලියන |
| කෙරීගෙන යන වැඩ | 2.04 |
| ව්‍යාපෘති පරිපාලන පිරිවැය | 1.67 |
| එකතුව | 3.71 |

## 5. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 5.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව , ව්‍යාපෘති මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදන සහ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාල පරිච්ඡේදය තුළ අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සැපයීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සලසන ලද ප්‍රතිපාදනය | සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් |
| --- | --- | --- | --- | --- | --- |
| | කුවේට් ඩිනාර් මිලියන | රු මිලියන | රු මිලියන | රු මිලියන | රු මිලියන |
| ආරබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල | 10 | 4,632 | - | - | - |
| ශ්‍රී ලංකා රජය | - | - | 10 | 2.94 | 2.94 |
| එකතුව | 10 | 4,632 | 10 | *2.94 | 2.94 |

*වර්ෂය අවසානයට ගෙවිය යුතු මුදල් ඇතුළත් නොකිරීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදල සමග මෙම මුදල එකඟ නොවේ.

## 5.2 භෞතික කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කාර්යයන් පැකේජ් 3 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියේ විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් තීරණය කර තිබුණි. කෙසේවුවද පැකේජ් 01 යටතේ පාලම් 08 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරු තෝරාගැනීම සඳහා ලංසු කැඳවීම හැර 2014 වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතිය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ආරම්භ කර නොතිබුණි.

(ආ) ලැබුණු තොරතුරුවලට අනුව, ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කළ යුතු පාලම් 25 ක් පිළිබඳ කරන ලද ශක්‍යතා අධ්‍යයනයන් පිළිබඳ වාර්තා මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශය විසින් විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට ඉදිරිපත් කර තිබුණි. කෙසේවුවද ශක්‍යතා අධ්‍යයනයන් සිදු නොකළ වෙනත් පාලම් 8 ක් ප්‍රතිසංස්කරණ කාර්යයන් සඳහා තෝරා ගෙන තිබුණි.

(ඇ) නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී ආර්ථිකමය හා කාර්යක්ෂම ආකාරයෙන් ව්‍යාපෘතියේ ඉලක්ක ඉටුකර ගැනීම තහවුරු කර ගැනීමට හැකිවන පරිදි සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය සඳහා සම්පූර්ණ සමස්ත ව්‍යාපෘති සැලැස්මක් සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ එක් එක් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ පළමු වර්ෂය අවසාන වන විටත් පිළියෙල කර නොතිබුණි.